ගෝමරන්කඩවල ප්‍රාදේශීය සභාව
---------------------------------------
ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය
------------------------------

1 මූල්‍ය ප්‍රකාශන
----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
------------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 දෙසැම්බර් 03 දින ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 නොවැම්බර් 11 දින ද විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2015 ඔක්තෝම්බර් 30 දින සභාවේ ලේකම්වරයා වෙත යවන ලදී.

1.2 තත්ත්වාගණනය කළ මතය
-------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට ගෝමරන්කඩවල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය සහ සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
--------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
-------------------------

ලේඛන අනුව උසාවි දඩ 2014 දෙසැම්බර් 31 දිනට රු. 1,363,866 ක් වුවද එය රු. 532,225 ක් ලෙස ගිණුම්ගත කර තිබීම හේතුවෙන් රු. 831,641 ක් අඩුවෙන් දක්වා තිබුණි.

1.3.2 විගණනය සඳහා සාක්ෂි නොමැතිවීම
-----------------------------------------

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොවීම නිසා රු.40,072,096 ක වටිනාකම වූ ගිණුම් ශේෂයන් 3 ක් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

1.3.3 නීති, රීති, රෙගුලාසිවලට අනුකූල නොවීම්.
---------------------------------------------

විගණනයේ දී නිරීක්ෂණය වූ නීති,රීති,සහ විධි විධානවලට අනුකූල නොවීම් පහත දැක්වේ.

| නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) 1989 අප්‍රේල් 17 දින අංක 554/5 දරන අති විශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශිත 1988 ප්‍රාදේශීය සභා ( මූල්‍ය හා පරිපාලන) රීති මාලාවේ 59 වැනි රීතිය | සභාබල ප්‍රදේශයට අදාල කර්මාන්ත පිළිබඳ ලැයිස්තුවක් විගණිත දිනය වූ 2015 දෙසැම්බර් 11 දින වන විටද පිළියෙල කර නොතිබුණි. |
| (ආ) පළාත් මූල්‍ය රීති අංක 237 | නිකුත් කල දින සිට මාස 06 ඉක්මවා තිබූ නමුත් ගෙවීම සඳහා ඉදිරිපත් නොවූ රු. 14,333 ක් වටිනා චෙක්පත් 05 ක් සම්බන්ධයෙන් විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ඇ) | පළාත් පාලන, පළාත් සභා හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ 1990 ඔක්තෝම්බර් 10 දිනැති අංක 41/90 දරන චක්‍රලේඛය | සභාව සතු වාහන 08 ක මාස 06 කට වරක් ඉන්ධන දහනය පරීක්ෂා කර නොතිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 1,613,663 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 224,055 ක් විය.

පසුගිය වර්ෂයට වඩා ආදායම් ආධාර ලැබීම් රු. 5,118,201 කින් වැඩි වීම සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 1,389,608 කින් වර්ධනය වීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

2.2 **ආදායම් පරිපාලනය**

2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යය සාධනය

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය ආදායම | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු..000 | රු.000 | රු.000 |
| බදු කුලී | 1,083 | 598 | 485 |
| බලපත්‍ර ගාස්තු | 90 | 59 | 31 |
| වෙනත් ආදායම් | 2,306 | 1,437 | 869 |

2.2.2 මුද්දර ගාස්තු

2014 දෙසැම්බර් 31 දිනට ප්‍රධාන ලේකම්වරයාගෙන් ලැබිය යුතු මුද්දර ගාස්තුව ගණනය කර අයකර ගැනීමට විගණිත දිනය වන 2015 දෙසැම්බර් 11 දින වන විටද කටයුතු කර නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

2014 දෙසැම්බර් 08 දින පැවැත් වූ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව භාණ්ඩ වර්ග 03 ක් අළුත්වැඩියා කිරීමටත්, භාණ්ඩ වර්ග 13 ක් ඉවත් කිරීමටත්, භාණ්ඩ වර්ග 37 ක් විනාශ කිරීමටත් නිර්දේශ කර තිබුණත් විගණිත දිනය වූ 2015 දෙසැම්බර් 11 දින වන විටද අවශ්‍යය කටයුතු ගෙන නොතිබුණි.

3.2 මානව සම්පත් කළමනාකරණය

අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව

2014 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත සහ තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සේවක සංඛ්‍යාව |
|---|---|---|---|
| විධායක මට්ටම | 01 | - | 01 |
| ද්විතික මට්ටම | 15 | 10 | 05 |
| තෘතීය මට්ටම | 16 | 15 | 01 |
| එකතුව | **32** | 25 | 07 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 1996 වර්ෂයේ සිට පුරප්පාඩුව පවතින ප්‍රාදේශීය සභාවේ ලේකම් තනතුරෙහි කාර්යභාර්ය වැඩ බලන පදනම මත ඉටුකරන අතර විගණිත දිනය වූ 2015 දෙසැම්බර් 11 දින දක්වා පුරප්පාඩුව පිරිවීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සංවර්ධන නිලධාරී, යන්ත්‍ර ක්‍රියාකරු සහ වැඩ පරීක්ෂක තනතුරුවල පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කර නොතිබුණි.

3.3 කොන්ත්‍රාත් පරිපාලනය

3.3.1 ගෝමරන්කඩවල පානීය ජල ව්‍යාපෘතිය

සභා බල ප්‍රදේශය තුල බීමට සුදුසු පානීය ජලය නොමැති වීමේ ගැටළුවට විසඳුමක් විසඳුමක් වශයෙන් පුර නැගුම ව්‍යාපෘතිය යටතේ පානීය ජල ව්‍යාපෘතියක් අදියර තුනක් යටතේ ක්‍රියාත්ක කිරීම සඳහා සභාව විසින් රු. 51,571,930 ක් වටිනා ගිවිසුම් තුනක් අත්සන් කර තිබුණි.

මේ සම්බන්ධයෙන් සිදුකළ භෞතික පරික්ෂාවේදි පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ඉංජිනේරු පිරිවිතරවලට අනුව මිනිත්තුවට ලීටර 300 ක ධාරිතාවයකින් යුතු වතුර මෝටරයක් සවි කිරීමට සැළසුම් කර තිබුණද , ඉදිකිරීමේ දී කොන්ත්‍රාත්කරු සවිකර තිබුණේ මින්ත්තුවට ජල ලීටර 100 ක ධාරිතාවයකින් යුත් මෝටරයකි.

(ආ) ධාරිතාවය ලීටර් 300 ක මෝටරය සඳහා රු. 175,000 ක ඇස්තමේන්තුවක් කර තිබුණද, ගෙවීම් කිරීමේ දී කොන්ත්‍රාත්කරුට වැඩ අංක 5.1 ට අනුව මිනිත්තුවට ලීටර 100 ක ධාරිතාවයකින් යුත් මෝටරයක් සඳහා රු. 200,000 ක මුදලක් ගෙවීම් කර තිබුණි. ඒ අනුව අඩු ධාරිතාවයෙන් යුත් මෝටරයක් සඳහා වැඩි මුදලක් ගෙවීම් කර තිබුණි.

(ඇ) ඉහත කී පරිදි ධාරිතාවය මිනිත්තුවට ලීටර 100 ක් වන මෝටරයක් සවි කිරීම නිසා ජල ටැංකිය පිරවීම සඳහා පැය 09 ක් ගතවන අතර, වැඩිපුර ගතවන පැය 06 ක කාලයක් සඳහා විශාල අමතර විදුලි බලයක් යෙදවීමට සිදුවී තිබුණි.

(ඇ) මිනිත්තුවට ලීටර 100 ක ධාරිතාවයකින් යුත් මෝටරය නිසා ටැංකිය පිරවීමට පැය 09 ක් ගතවීමෙන් බෙදාහැරීමේදී එම ටැංකිය පැයක කාලයක් තුල හිස්වීම නිසා පාරිභෝගිකයාට අඛණ්ඩව ජල සැපයීමක් සිදු කිරීමට නොහැකි වි තිබුණි.

(ඉ) නිවාස සැපයුම් සඳහා ඕනෑම අවස්ථාවක කේවල ජල සැපයුම විසන්ධි කල හැකි උපකරණය වන පෙරුල් සවිකර ඇති බවට සහතික කොට රු. 1,232,200 ක මුදලක් ගෙවා තිබුණ ද එම වැඩ කොටස ඉටුකර නොතිබුණි.

(ඊ) ඉදිකිරීම් සිදු කිරීමේ දී නිසි පරිදි සක්‍යතා අධ්‍යනයක් නොකිරීම නිසා ජල ටැංකිය ඉදිකිරීමේ ස්ථානයක් හා උස ප්‍රමාණය නිසි පරිදි හඳුනාගෙන නොතිබීමේ හේතුවෙන් ප්‍රදේශයේ නිවාස 40 කට පානීය ජලය සැපයීමට නොහැකි වී තිබුණි.

(උ) මෙම ජල සැපයුම් ව්‍යාපෘතිය සඳහා ලිඳක් මගින් ජලය බෙදාහැරීමේ ක්‍රියාවලියක් වූ නමුත් ජල පිරිපහදු කිරීමේ ක්‍රමයක් ඇතුලත් කර නොතිබුණි. ලිඳ පිළිබඳ භෞතිකව පරීක්ෂා කිරීමේ දී ජලය දුඹුරු පැහැයක් ගෙන තිබු අතර ටැංකියේ බිත්තිවල හා පතුලෙහි ජල මණ්ඩි දක්නට තිබුණි.

(ඌ) සෞඛ්‍යාරක්ෂිත පානීය ජලය නොමැති වීම හේතුවෙන් මේ වන විට ගෝමරන්කඩවල ප්‍රාදේශයට අයත් ග්‍රාම සේවක වසම් 10 තුල පමණක් වකුගඩු රෝගීන් 108 ක් වාර්තා වී තිබුණි. රු. මිලියන 45 ක් වැය කර තිබූ මෙම පානීය ජල ව්‍යාපෘතිය මගින් බීමට සුදුසු පානීය ජලය ප්‍රමාණවත් පරිදි අඛණ්ඩව නිවැසියන්ට ලබා දීමට විගණිත දිනය වූ 2015 දෙසැම්බර් 11 දින වන විටද අසමත් වී තිබුණි.

(එ) 2007 අංක 13 හා 2009 අංක 18 දරන මුදල් සංශෝධන පනත්වලින් සංශෝධිත 2005 අංක 03 දරන මුදල් පනතේ III කොටසේ ප්‍රකාර රු. 22,236,200 **ක් වූ ව්‍යාපෘතියේ පළමු අදියර වෙනුවෙන්** කර්මාන්ත සහතික අරමුදල් බද්ද (CIGFL) වන රු. 55,590 ක් රඳවා ගෙන දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ට යැවීමට කටයුතු කර නොතිබුණි.

3.3.2 ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ල ඉදිකිරීම

------------------------------------------------

පුරනැගුම ව්‍යාපෘතිය යටතේ ප්‍රාදේශීය සභාවේ කාර්යාලය සඳහා දෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීමට රු. 31,600,000 වටිනාකමකට මාස 06 ක කාලයක් තුල ඉදිකිරීම් අවසන් කිරීමේ පදනම මත 2012 දෙසැම්බර් 13 දින කොන්ත්‍රාත් ගිවිසුම් අත්සන් කර තිබුණි. මේ සම්බන්ධයෙන් 2015 දෙසැම්බර් 11 දින කරන ලද භෞතික පරික්ෂාවේදි පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) ගොඩනැගිල්ලේ වැඩ නිමකර 2014 අගෝස්තු 18 දින සභාව වෙත භාරදී තිබුණ ද එහි වහලයෙහි පැති දෙකක ප්‍රධාන යට ලී දෙකක් කැඩීයාම හේතුවෙන් වහලයේ එම පැති දෙක පහත් වී තිබුණු අතර, එය පිළිසකර කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ගොඩනැගිල්ලේ උඩු මහලයේ පිහිටි රැස්වීම් ශාලාව, ලේඛනගාරය, මහජන ගැලරිය යන ස්ථානවලට වැසි ජලය සිවිලම තුලින් ගලා ඒම නිසා එම ශාලා ප්‍රයෝජනයට ගත නොහැකි තත්වයට පත්වී තිබුණි. ලේඛනාගාරය තුල තිබූ ඡායා පිටපත් යන්ත්‍රය හා පරිඝනක යන්ත්‍ර ජලයට තෙමීම නිසා ක්‍රියා විරහිත තත්වයට පත්වී තිබුණි. ගොඩනැගිල්ලේ වහලය සකස් කිරීමේ ඉංජිනේරු නිර්මාණ සැලැස්මේ තිබූ අඩුපාඩු හේතුවෙන් ඇති වී තිබූ මෙම තත්වය නිසා වහලය වෙනුවෙන් ගෙවා තිබූ රු. 2,113,650 වියදම නිශ්කාර්ය බවට පත්වී තිබුණි.

(ඈ) 2007 අංක 13 හා 2009 අංක 18 දරන මුදල් පනත්වලින් සංශෝධිත 2005 අංක 03 දරන මුදල් පනතේ III කොටසේ ප්‍රකාර රු.36,851,944 ක් වූ ව්‍යාපෘතියේ පළමු අදියර වෙනුවෙන් කර්මාන්ත සහතික අරමුදල් බද්ද (CIGFL) වන රු. 92,130 ක් රඳවා ගෙන දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ට යැවීමට කටයුතු කර නොතිබුණි.

4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය
-------------------------------------------

4.1 අයවැය පාලනය
-----------------------

සමාලෝචිත වර්ෂයේ තත්‍ය වියදම සහ අයවැය ප්‍රතිපාදන අතර සියයට 52 සිට සියයට 81 දක්වා වූ පරාසයක විචලනයක් පැවතුණි. ඒ අනුව වාර්ෂික අයවැය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබු බව නිරික්ෂණය විය.

5. පද්ධති හා පාලන
--------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) අයවැය පාලනය
(ඇ) ආදායම් පරිපාලනය
(ඈ) වත්කම් කළමනාකරණය
(ඉ) කොන්ත්‍රාත් පරිපාලනය
(ඊ) මානව සම්පත් කලමනාකරණය